**ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි මස 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ විගණන මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී. මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) මූලධන වියදම්

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ.66/69 මාරු කිරීම් යටතේ පාකිස්ථාන ණය යෝජනා ක්‍රමය යටතේ යුධ ටැංකි (APC-15) මිලදී ගැනීමට ලද ප්‍රතිපාදන වලින් රු.15,795,903 ක් ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ රේඩාර් පද්ධතියට අමතර කොටස් මිලදී ගැනීම සඳහා යොදා ගෙන තිබුණි. | (i) වර්ෂය ආරම්භයේදී ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී තිබුණු රු. 272,000,000 ක ප්‍රතිපාදන සංශෝධිත ඇස්තමේන්තුව මගින් රු.15,000,000 දක්වා අඩු කරන ලදී. නමුත් එම භාණ්ඩ නිෂ්කාශන කටයුතු සඳහා රු. 25,700,000 ක පමණ ප්‍රතිපාදන අවශ්‍ය වීම.<br><br>(ii). පාකිස්තානු ණය යෝජනා ක්‍රමය යටතේ 2022 වර්ෂයේදී මිලදී ගැනීම සඳහා සැලසුම් කර තිබුණු APC 10 ට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2022 වර්ෂයේදි සම්පූර්ණ කිරීමට නොහැකි වීම. | විදේශයන් දෙකක, ව්‍යාපෘති දෙකක් වෙනුවෙන් අරමුණු දෙකකට ලද ණය බැවින් අදාල අරමුණු වෙනුවෙන් පමණක් වැය කල යුතු වීම |

### (ආ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ACA 6 ආකෘතිය ප්‍රකාර මූල්‍ය නොවන වත්කම් - 9152 ප්‍රවාහන උපකරණ හා යන්ත්‍රෝපකරණ වල හර සහ බැර වීම් වලට අදාල අගයන් භාණ්ඩාගාර ශේෂ පිරික්සුමේ හර හා බැර ශේෂ සමඟ පිළිවෙලින් රු.54,396,990 ක් සහ රු.87,423,189 කින් නොසැසඳුනි. | ACA 6 ආකෘතියෙහි ඇතුළත් වන්නේ සිගාස් වෙබ් යෙදුම වෙත ජනනය කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාව වේ. එහි වර්ෂය තුල මූල්‍ය නොවන වත්කම් අඩු වැඩි වීම් ඇතුලත් වේ. නමුත් භාණ්ඩාගාර ශේෂ පිරික්සුමේ හර හා බැර ශේෂ වල ඇතුළත් වන්නේ වර්ෂයේ මූල්‍යමය ගණුදෙනු සහ ජර්නල් අගයන් පමණි. | දෙපාර්තමේන්තු පොත් වල ගිණුම් ගත වීමට අදාල හර බැර ගිණුම් සාරාංශ මගින් භාණ්ඩාගාරය වෙත වාර්තා කරන බැවින් දෙපාර්තමේන්තු හා භාණ්ඩාගාර ශේෂ පිරික්සුම වෙනසක් නොවිය යුතු බව. |

| | | |
|---|---|---|
| (ii) මු.රෙ.109 යටතේ ගුවන් යානා 03 ක අලාභහානි කපා හැරීමේදී අනුමත වටිනාකමට වඩා රු.85,255,268 ක් අඩුවෙන් කපා හැර තිබූ අතර තවත් ගුවන් යානාවක අලාභහානි පාඩු යටතේ කපා හැරීමේදී අනුමත වටිනාකමට වඩා රු. 14,772,702ක් වැඩියෙන් කපා හැර තිබුණි. | පරීක්ෂණ අධිකරණ මණ්ඩලයන් මගින් සිදුවීම් 4ට අදාලව අලාභයන් වෙන් වෙන් වශයෙන් ගණනය කිරීමෙන් අනතුරුව පොත් වලින් කපාහැරීමට අවශ්‍ය අනුමැතිය ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ලබාගෙන, මු.රෙ.109 ප්‍රකාරව අලාභ පොත් වලින් කපා හැරීම සිදුකිරීම සඳහා වගකිව යුතු අංශයන් වෙත යොමු කර ඇත. | හානි පාඩු නිවැරදිව හදුනාගෙන අනුමැතිය ලබා ගැනීම හා කපා හැරීම කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 85 (1) (ඇ) ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හැකිතාක් තාත්විකව හා නිවැරදි විය යුතු වුවත් ආදායම් ශීර්ෂ 20.03.02.16 - ගුවන්යානා කුලී ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂයේ මෙන්ම ඉකුත් වර්ෂ 06 ක් තුල සියයට 33 සිට සියයට 91 දක්වා අවකරණය කර සංශෝධනය කර තිබුණි.එමෙන්ම 2016 වර්ෂයට සාපේක්ෂකව සියයට 24 ත් සියයට 94 ත් ලෙස ආදායම් ඉපැයීම අහිතකර අවකරණයකින් යුතුව විචලනය වී පැවතුණි. | ඉදිරියේදි ගුවන්යානා කුලී ආදායම් ඇස්තමේන්තු වඩාත් තාත්වික ලෙස සකස් කිරිමට පියවර ගනු ලැබේ. | ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හැකිතාක් තාත්වික සහ නිවැරදි ලෙස ඇස්තමේන්තු සකස් කිරිමට කටයුතු කල යුතුය. එම ආදායම අයකර ගැනීමට කාලීන හා කාර්යක්ෂම වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) මුදල් රෙගුලාසි 128 (2) (ඉ) ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවත්, වර්ෂ 4 ත් 19ත් අතර කාල ප්‍රමාදයකින් යුතුව ගුවන් යානා කුලී හිඟ ආදායම් එකතුව රු.12,674,073 ක් අයකර ගෙන නොතිබුණි. ඒ තුල ඇතුලත් පෞද්ගලික ආයතන 02 කින් ලැබිය යුතු හිඟ මුදලේ එකතුව රු. 3,612,665 ක් විය. | මෙම හිඟහිටීම් පියවීම සඳහා අමාත්‍යාංශ වල ප්‍රතිපාදන නොමැති බැවින් හිඟ ශේෂ ලියා හැරීමට අදාලව කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන ලෙස ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් යොමු කර ඇත. | ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන යෙදිය යුතු බව වගකිව යුතු නිළධාරියෙකුගේ ලිඛිත ඉල්ලීම් හා ගිවිසුම් මත කුලියට දීම කළ යුතු බව. |
| (ඇ) රත්මලාන ගුවන් හමුදා මූලික කඳවුර තුල පවතින ගුවන් හමුදා කෞතුකාගාරයේ 2022 වර්ෂයේ ඉපයූ රු.21,303,078 ක ආදායමින් රජයට අහිමිවූ ආදායම රු.18,912,131 ක් විය. | ත්‍රිවිධ හමුදාවේ අභ්‍යන්තර අරමුදල් පරිපාලනය කිරීම සම්බන්ධව ආරක්ෂක ලේකම්තුමා විසින් මුදල් අමාත්‍යාංශ ලේකම්තුමා දැනුවත් කරන ලදී . ඒ අනුව මුදල් අමාත්‍යාංශයෙන් ලැබෙන උපදෙස් පරිදි අභ්‍යන්තර අරමුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ගුවන් හමුදාව සැලසුම් කර තිබේ. | රජයේ වත්කම් උපයෝජනයෙන් උපයන ලද ආදායම රජයට මුළුමනින්ම බැර කල යුතු බව |

## 2.2 වියදම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රාජ්‍ය වියදම් පාලනය කිරීම වෙනුවෙන් 2022 අප්‍රේල් 26 දිනැති මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම්ගේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2022 හි 02 ඡේදය ප්‍රකාර රාජ්‍ය වියදම් පාලනය කිරීමට සියළුම රාජ්‍ය ආයතනයන් දැඩිව ක්‍රියාමාර්ග ගත යුතු බව දන්වා ඇතත් විදේශ අධ්‍යයන චාරිකා හා | අදාළ චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසුව 2022 මැයි මස සිට 2022 දෙසැම්බර් දක්වා කාලය තුළ 224-1-1-0-1102 යටතේ ආරක්ෂක අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් පසුව විදේශ ගමන් සඳහා රු.8,342,042 ක වැයක් දරා තිබුණි. | රාජ්‍ය වියදම් දැඩිව පාලනය කිරීමට චක්‍රලේඛය ප්‍රකාරව මෙන්ම රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් වූ කාලීන අවශ්‍යතාවයද සලකා වියදම් පාලනය කල යුතු බව . |

පුහුණු වෙනුවෙන් වැය ශීර්ෂ 224-1-1-1102 යටතේ රු.8,342,043 ක් වූ වැය දරා තිබුණි. එමෙන්ම වැය ශීර්ෂ 224-1-1-2401 යටතේ විදේශ පුහුණු සංචාර වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ මැයි සිට අගෝස්තු දක්වා රු.31,246,205 ක් වැය කර තිබුණි.

## 2.3 නීතිරීති රෙගුලාසි වලට අනුකූල නොවීම

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

| | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන් දීමේ නිළධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව 2021 ඔක්තෝබර් 26 දිනැති 2021/02 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 4.5 | වාර්තා නොකරන ලද කිසිදු බැදීමක් හෝ බැරකමක් 2022 වර්ෂය තුළ නිරවුල් නොකල යුතු වුවත් එම නියමයෙන් බැහැරව ඉකුත් වර්ෂයේ බැදීම් ලේඛණයේ ඇතුළත් කර නොතිබුණු අවස්ථා 04 කට අදාළව එකතුව රු.1,703,403 ක් වූ බැරකම් 2022 වර්ෂයේදී ගෙවා තිබුණී. | බැරකම් ශේෂයට අදාලව CIGAS ගිණුම්කරණ පද්ධතියේ එම ශේෂය බැරකම් ලෙස දක්වා තිබුණද අතපසුවීමකින් බැරකම් ලේඛනයේ ලේඛනගත කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ය ප්‍රකාරව වාර්තා නොකරන ලද කිසිදු බැදීමක් හෝ බැරකමක් සමාලෝචිත වර්ෂය තුල නිරවුල් කල නොහැකි බව. |
| (ii) | මුදල් රෙගුලාසි 128 (2) එ | රජයේ ආදායම් පිළිබදව ගණන්දීමේ නිලධාරි විසින්, අවශ්‍යතැන්හි ආර්ථික ක්‍රමයේ හා වෙනත් තත්ත්වයන්ගේ වෙනස්වීම් ගැන සැලකිලිමත්ව බදු ගාස්තු අයකිරීම් සමාලෝචනය කොට ඒවා ප්‍රතිශෝධන කිරීමේ පියවර ගත යුතුය. නමුත් එයින් බැහැරව රත්මලාන මූලික කඳවුර තුල ගොඩනැගිලි 04 ක් බදු දීම වෙනුවෙන් අය වූ මුළු බදු කුලී ආදායම රු.1,511,000 කින් රු.161,200 ක් පමණක් | (i) විගණන ඡේදයේ පෙන්වා දී ඇති පරිදි රජයේ තක්සේරු වටිනාකම රජයේ ගිණුමට බැර කිරීම සඳහා අවශ්‍ය උපදෙස් වගකිවයුතු අංශයන් වෙත ලබා දීමට කටයුතු කෙරේ.<br>(ii) මෙම ගොඩනැගිලි කුලී ආදායම සේවා ආයතන අරමුදලට බැර කරගන්නා නමුදු එම මුදල් නැවත කඳවුරු සේවා පුද්ගලයින්ගේ සුභසාධන කටයුතු සඳහා යෙදවීම සිදුකරනු ලබයි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ආදායම් පිළිබදව ගණන්දීමේ නිලධාරි විසින්, අවශ්‍යතැන්හි ආර්ථික ක්‍රමයේ හා වෙනත් තත්ත්වයන්ගේ වෙනස්වීම් ගැන සැලකිලිමත්ව බදු ගාස්තු අයකිරීම් සමාලෝචනය කොට ඒවා ප්‍රතිශෝධන කල යුතු බව, සහ එම ආදායම් රජයේ ආදායමට ගත යුතු බව . |

රජයට බැර කර තිබූ අතර මුළු එකතුව රු.1,349,200 ක් වූ ගොඩනැගිලි කුලී ආදායම් රජයට අහිමි වී තිබුණි.

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් පරිදි රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුමට අදාල ණය මුදල් ගෙවා අවසන් කිරීමට පෙර විශ්‍රාම ගිය /මිය ගිය/සේවය හැර ගිය නිලධාරීන්ගේ අත්තිකාරම් ණය ශේෂ අයකර ගත නොහැකි අවස්ථා වලදී ඇපකරුවන්ගෙන් හෝ උරුමක්කාරයින්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කල යුතු වුවත්, එම නියමයන්ගෙන් බැහැරව නිළධාරීන් 207 කගේ වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිටි ණය ශේෂය රු.8,267,831 ක් විය. | තවදුරටත් ඉතිරිව පවතින හිඟ ණය ශේෂයන් නිරවුල් කර ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීමේ කටයුතු කරමින් පවතී. එසේ ලද තොරතුරු මගින් පැරණි හිඟ ණය ශේෂයන් නිරවුල් කරගැනිම අඛණ්ඩව සිදුවන අතර තොරතුරු සොයාගත නොහැකි ණය ශේෂයන් මුදල් අමාත්‍යාංශය හරහා කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදුකරයි | අත්තිකාරම් ණය සම්බන්ධයෙන් හිඟ හිටි ණය අයකර ගැනීමට ආයතන සංග්‍රහයේ **XXIV** පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් පරිදි විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා මොරවැව කඳවුරේ රජයේ ආදායම් වෙනුවෙන් ක්‍රියාත්මක නොවන ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් වන කෘෂිකර්ම ව්‍යාපෘතියක් සඳහා රු.5,290,000 ක් වටිනා | ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ ප්‍රතිපූරක 35 හි 2.14.1 යටතේ මෙම ගොයම් කපන යන්ත්‍රය මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇති අතර, ශ්‍රී ලංකා ගුවන් හමුදා මුලස්ථානය මගින් මෙම ගොයම් කපන යන්ත්‍රය මිලදී ගැනීම වඩාත්ම සුදුසු ප්‍රසම්පාදන | රජයේ මුදල් වියදම් කිරීමේදී රජයේ අරමුණු වෙනුවෙන් වැය කල යුතු අතර අදාල වියදමේ ප්‍රතිලාභ රජයට ලැබිය යුතු වීම. |

| | | |
|---|---|---|
| ගොයම් කපන යන්ත්‍රයක් රජයේ මුදලින් මිලදී ගෙන තිබුණි. | ක්‍රියාවලිය ලෙස ප්‍රාදේශිය ප්‍රසම්පාදනය තෝරාගෙන ඇත. කෘෂිකාර්මික ව්‍යාපෘතිය ලාභ ලබා ගැනිමේ අරමුණෙන් තොරව සුහසාධනය සැලසීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන බැවින් මෙන්ම රජයේ අරමුදලට මුදල් බැරවීමක් සිදු නොවුනද ජාතික ආර්ථිකයට ප්‍රතිලාභ ලබාදීම සිදුකරයි. | |

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 128 (2) (ඊ) අනුව රජය සතු වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් වූ විධිමත් විධිවිධාන යෙදිය යුතු බව ගණන් දීමේ නිළධාරීගේ වගකීම වුවත් එයින් බැහැරව ACA 6 ආකෘතිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව එකතු වටිනාකම රු53,846,539,763 ක්වූ ගුවන් යානා 110 කින් ගුවන් යානා 66ක් වර්ෂ 1 සිට වර්ෂ 23 ක් දක්වා වූ දීර්ඝ කාලයක සිට මෙහෙයුම් කටයුතු වලින් බැහැරව අක්‍රීයව පැවතුනි. | වර්ග 27 කට අයත් ගුවන් යානා 66 ක් දීර්ඝ කාලීනව අක්‍රීය වී ඇත. | රජය සතු වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් වූ විධිමත් විධිවිධාන යෙදිය යුතු බව . |
| (ආ) කටුනායක ගුවන් හමුදා කඳවුරෙහි රථවාහන අංශය තුල රු.5,016,000 වටිනා ලැන්ඩ් රෝවර් ඩිෆෙන්ඩර් 08 ක් වසර 3 කට අධික කාලයක් අළුත්වැඩියා නිම නොකර පැවතුණි. | වාහන 06 ක් අළුත්වැඩියා කරමින් පවතින අතර වාහන දෙකක අළුත්වැඩියා කටයුතු ආරම්භ කර නැත. | අළුත්වැඩියා කටයුතු කඩිනමින් අවසන් කර අදාල ඩිෆෙන්ඩර් උපයෝජනයට ගත යුතු බව. |
| (ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කටුනායක, හිඟුරක්ගොඩ, රත්මලාන යන මූලික කඳවුර තුල පැවති විවිධ ගබඩා අංශයන් හි නිල ඇඳුම්, ගොඩනැගිලි ද්‍රව්‍ය , විදුලි උපකරණ ඇතුළු | 2022 වර්ෂයේ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු අත්හිටුවීම, හදිසි අවශ්‍යතාවයකදී භාණ්ඩ හිඟයකින් තොරව යොදවා ගැනීමේ අවශ්‍යතාවය, භාණ්ඩ ලබා ගැනීමට කඳවුරු වලින් ඉල්ලීම් ඉදිරිපත් | නිසි අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම් සිදුකල යුතු බව මෙන්ම භාණ්ඩ තොග නිෂ්කාර්යව තබා නොගත යුතු බව. |

| | |
|---|---|
| භාණ්ඩ වර්ග 31 කට අදාල එකතු වටිනාකම රු29,209,872 ක් වූ තොග භාවිතයකින් තොරව වසර 01 ත් 09 ත් අතර කාලයක සිට නිෂ්කාර්යව ගබඩා තුල පැවතුණි. | නොවීම, අනාගත අවශ්‍යතා මත මිලදී ගත් තොග ගබඩා තුල පැවතීම, ඉතිරි මුළු තොග කඳවුරු ඒකක අවශ්‍යතා සඳහා නිකුත් කිරීම, සාම සාධක හමුදාව වෙත තොග යැවීමේදී බර ප්‍රමාණය මත රඳවා තිබීම |

## 3.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/5 හි 06 ඇමුණුම (1) අනුව ඉදිරිපත් කල යුතු පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය තුල අනාවරණය කල යුතු වුවත්, පාඩු සිද්ධි 190 කට අදාල මුළු එකතුව රු. 577,625,395 ක් මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම සකස් කිරීමේදී අවස්ථා කිහිපයකදී මෙම තොරතුරු නිසිලෙස සන්නිවේදනය නොවීමේ ගැටළුවක් තිබෙන බව අනාවරණය වී ඇත. මෙම තත්ත්වය මග හරවා ගනිමින් කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වා සිටිමි. | අදාල මාර්ගෝපදේශ ප්‍රකාර හානි පාඩු මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කල යුතු බව. |
| (ආ) 2022 වර්ෂයට අදාල අවස්ථා 5 කදී එකතු වටිනාකම රු.38,625,367 ක්වූ හානි,පාඩු මු.රෙ.109 යටතේ අලාභයන් ලෙස කපාහැරීමට අනුමැතිය ලැබී තිබු නමුත් ඇමුණුම (ii) මු.රෙ. 109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුලත් කර නොතිබුණි. | 2022 වර්ෂය තුල මු.රෙ. 109 යටතේ අනුමැතිය ලබාදී තිබූ හානි පාඩු හය (6) කට අදාල වටිනාකම් මු.රෙ. 109 යටතේ හානි පාඩු කපාහැරීම පිළිබඳ ප්‍රකාශනයේ ඇතුලත් නොකිරීමට හේතුව අදාල ගොනුවල කටයුතු අවසන් නොවීමයි. | සමාලෝචිත වර්ෂයේ මු.රෙ.109 යටතේ අලාභයන් කපාහැරීමට අනුමැතිය ලැබී තිබූ හානි පාඩු මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කල යුතුය. |

## 3.4 අනාර්ථික ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සාම සාධක හමුදාවට යැවීම සඳහා 2022 අප්‍රේල් 01 දින රු.මිලියන 41.9 ක් ගෙවා ලැන්ඩ්රෝවර් ඩිෆෙන්ඩර් ජීප් රථයක් මිලදීගෙන තිබුණි. නමුත් 2023 මැයි 19 දින වන විටත් එම ජීප් රථය සාම සාධක හමුදාව වෙත යවා නොතිබුණි. | i. මෙම රථය මිලදීගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ වී ඇත්තේ 2020 වසරේදී වන අතර සාම සාධක මෙහෙයුම් නිරීක්ෂණය කිරීමට පැමිණෙන විශේෂ පුද්ගලයින් හට ප්‍රවාහන පහසුකම් සැපයීමේ අවශ්‍යතාවය වෙනුවෙනි.<br>ii වාහනය ඉල්ලුම් කරන විට සාම සාධක මෙහෙයුම් දෙකක් පැවතියද දැනට එක් මෙහෙයුමක් පමණක් පවතී. ඒ අනුව ඒ සඳහා හෝ අලුතින් ආරම්භ වන සාම සාධක මෙහෙයුමකට අවශ්‍යතාවය අනුව මෙම රථය අනුයුක්ත කිරීමට බලාපොරොත්තුවෙන් දැනට ගුවන් හමුදා විධායක රථවාහන සංචිතය යටතේ ඇත. | අධික වැයක් දරා රජයට ලබාගත් වත්කම් නිෂ්කාර්ය නොකර අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනයට යෙදවිය යුතු බව. |
| (ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු පුහුණු ගුවන් යානා බලඝනය වර්ධනය සඳහා 2018 ඔක්තෝබර් 17 දින රු.මිලියන 946.32 ක් ගෙවා චීනයෙන් මිලදී ගන්නා ලද ප්‍රාථමික පුහුණු ගුවන්යානා 06 කින් එකක් 2020 දෙසැම්බර් 15 දින අනතුරට ලක්වී සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණි.මිලදී ගන්නා ලද ඉතිරි ගුවන් යානා 05 ද එන්ජින් පිරිවැඩියාව ප්‍රමාද වීම හේතුවෙන් වසර 2කට අධික කාලයක් තිස්සේ පුහුණු කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. ඒ අනුව දරණ ලද මුළු වියදම අනාර්ථික වියදමක් වී තිබුණි | PT - 6 ගුවන් යානාවන්වල එන්ජිමේ පියාසර ආයු කාලය පැය 600 කි. නමුත් මේවන විට සියලුම එන්ජින් උපයෝජනයෙන් බැහැරව පවතී. මෙම එන්ජින්වල පිරිවැඩියා (Overhaul) කටයුතු ප්‍රමාද වීම හේතු කොටගෙන මෙම තත්වය හටගෙන ඇත. | රජයේ මුදල් වැය කිරීමේදී ඊට අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනයට අවශ්‍ය නිසි කටයුතු සිදු කල යුතුය.මෙම ගුවන් යානා ඒන්ජින් වල පියාසර පැය ගණන අවසන් වන විට ඒ සඳහා යොදනු ලබන ඒන්ජින් සූදානම් කර තැබිය යුතුයි. |

## 3.5 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී "මෙත් සෙවන" සහ "අපි වෙනුවෙන් අපි" නිවාස ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් රු .36,572,648ක් රජයේ ගිණුම් වලින් බැහැර වූ ගුවන් හමුදාවේ මධ්‍යම සුභසාධන හා පුනරුත්ථාපන අරමුදල වෙත බැර කරවාගෙන පසුව ඊට අදාල ප්‍රතිලාභීන් වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. | 'අපි වෙනුවෙන් අපි' අර්ධ නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ 'මෙත් සෙවන' නිවාස ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් ලබාදෙනු ලබන සියලු මුදල් අදාල ප්‍රතිලාභීන්ගේ ගිණුම් වෙත ප්‍රේශණය කිරීමේ අතරමැදි ගිණුමක් ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාපතිතුමා යටතේ සුභසාධක අධ්‍යක්ෂකය මගින් කලමණාකරනය වන මධ්‍යම සුභසාධන සහ පුනරුත්තාපන අරමුදල (CW&RF) යොදා ගන්නා අතර මෙම ගිණුම ගුවන් හමුදා සේවා පුද්ගලයින්ගේ සුභසාධන කටයුතු සඳහා භාවිතා කරනු ලබන ගිණුමකි. | රජයේ මුදල් රජයේ ගිණුම් වලින් බැහැරව වෙනත් රාජ්‍ය නොවන ගිණුම් මගින් ගෙවීම් වෙනුවෙන් යොදවා නොගත යුතු බව සහ එම වැය රජයේ ගිණුම් වලින් බැහැර වීම හේතුවෙන් විගණනයට ලක් නොවීම, රාජ්‍ය මුදල් වැය කිරීම මුදල් රෙගුලාසි වලට අදාලව සිදු විය යුතු වීම. |
| (ආ) | 2021 මැයි 21 සිට අගෝස්තු 19 දක්වා කාලය තුල "X Press Pearl" නෞකාවේ අනතුර මැඩපැවැත්වීම සඳහ දායකත්වය ශ්‍රී ලංකා ගුවන් හමුදාව ලබා දීම වෙනුවෙන් ඇ.එ.ජ.ඩො 2,875,136.55 ක වන්දි මුදලක් ප්‍රතිපූර්ණය විය යුතුව පැවති අතර ඒ තුල ඇතුලත් ඇ.එ.ජ.ඩො 1,149,500 ක් වූ අවදානම් දීමනාව ලබා ගැනීමට අවශ්‍ය වැඩිදුර සාක්ෂි ගුවන් හමුදාව විසින් ඉදිරිපත් නොකිරිම හේතුවෙන් අදාල වන්දි ගෙවන පාර්ශව එය ගෙවීම ප්‍රතික්ෂේප කල බැවින් එම මුළු මුදලම රජයට අහිමි වී පැවතුණි. | (i) 'X Press Pearl' නෞකාවේ සිදුවූ අනතුර වෙනුවෙන් ගිනි නිවීම හා ඒ හේතුවෙන් අපවිත්‍ර වු වෙරළ තීරය පවිත්‍ර කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් යෙදවූ දායකත්වය සඳහා අවස්ථා කිහිපයකදී නීතිපති දෙපාර්තමේන්තුව දැනුවත් කොට ඇත. ඒ අනුව එකතුව ඇ.එ.ජ.ඩො 3,449,867ප්‍රමාණ ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙනුවෙන් ඉල්ලීම් කරන ලදී.<br><br>(ii). කෙසේ වෙතත්, ගුවන් හමුදාව විසින් ඉල්ලා සිටි අවදානම් දීමනාව ගෙවීමට අදාළ නැව් රක්ෂණ සමාගම විසින් සිය අකමැත්ත පළකොට ඇත. | වන්දි ප්‍රදානයට අදාල අවධානම් දීමනාව ලබා ගැනීම වෙනුවෙන් විධිමත් සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් රජයට විශාල මුදලක් අහිමි වන නිසා විධිමත් සාක්ෂි ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ඉදිරිපත් කල යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) 2004-2013 දක්වා කාලය තුල ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් විදේශයන් වෙත අළුත්වැඩියාවන් සඳහා යවන ලද එකතු වටිනාකම ඇ.එ.ජ.ඩො 179,633 ක්වූ ගුවන් යානා අමතර කොටස් 50 ක්ද 2016 සිට 2020 දක්වා කාලය තුල විදේශ අළුත්වැඩියා වෙත යවන ලද ගුවන් යානා අමතර කොටස් 53 ක් වර්ෂ 2 සිට 18 දක්වා කාලයක් ගත වී තිබුණද ගුවන් හමුදාව වෙත ලැබී නොතිබුණි. | නීතිමය පියවර ගැනීම සඳහා ප්‍රමාණවත් කරුණු නොමැති බව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නීති අධ්‍යක්ෂක විසින් ප්‍රධාන ප්‍රසම්පාදන නිළධාරී වෙත දැනුවත් කර ඇත. පසුව ගුවන් යානා ඉන්ජිනේරු අධ්‍යක්ෂක වෙත කරුණු ගොනු කරණ මෙන් දැනුවත් කිරීමෙන් අනතුරුව නීතිමය පියවර ගැනිමට කරුණු සම්පාදනය කරමින් පවතී. | අළුත්වැඩියාවන් සඳහා විදේශයන් වෙත යවන ලද ගුවන් යානා අමතර කොටස් ප්‍රමාදයකින් තොරව අළුත්වැඩියා කර ගැනීමට කටයුතු කල යුතු අතර දීර්ඝ කාලීන ප්‍රමාදයන් සම්බන්ධයෙන් නෛතික කටයුතු කඩිනමින් අවසන් කල යුතු වීම . |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(i)** සමාලෝචිත වර්ෂය අවසානයට ගුවන් හමුදාවේ අධිකාරීලත් නිලධාරීන් අනුමත සංඛ්‍යාව 2557 ක් වූ අතර ඉන් පුරප්පාඩු 464 ක් පැවතුණි. අධිකාරි නොලත් (සෙසු නිලයන්) නිලධාරීන් අනුමත සංඛ්‍යාව 34,381 ක්වූ අතර ඉන් පුරප්පාඩු 5324 ක් විය. | (අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් හට/ගුවන් කාන්තාවන් (නිත්‍ය/ස්වෙච්ඡා) පිලිබද දත්තයන් පහත සඳහන් පරිදි වේ.<br><br>අනුමත සේවක සංඛ්‍යාව (සෙසු නිලයන්) — 34381<br>2022.12.31 වන දිනට පුරප්පාඩු — 5324<br>2023.05.01 වන දිනට පුරප්පාඩු — 6780 | පුරප්පාඩු පිරවීමට හෝ තත්‍ය කාර්ය මණ්ඩලයට ගැලපෙන ලෙස අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචනය කර ගැනීමට කටයුතු කල යුතු වීම. |

| | | |
|---|---|---|
| (ii) 2022 දෙසැම්බර් 31 දින වන විට සිවිල් කාර්ය මණ්ඩලයේ (ජ්‍යෙෂ්ඨ/තෘතිය/ද්විතිය/ප්‍රාථමික) අනුමත සේවක සංඛ්‍යාව 3057 කින් පුරප්පාඩු 769 ක් පැවතුණි. | මෙම පුරප්පාඩු මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | පුරප්පාඩු පිරවීමට හෝ තත්‍ය කාර්ය මණ්ඩලයට ගැලපෙන ලෙස අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචනය කර ගැනීමට කටයුතු කල යුතු වීම. |